# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.12 පැය 2240 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/718/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>

## 01. ද්විත්ව මනුෂ්‍ය ඝාතනයක් - රාජාංගනය පොලිස් වසම

2025.04.12 වන අද දින උදෑසන කාලයේ රාජාංගනය පොලිස් වසමේ යාය 17 ප්‍රදේශයේ නිවසක සිටි පුද්ගලයින් දෙදෙනෙකුට තියුණු ආයුධවලින් පහරදී ඝාතනය කර ඇති බවට රාජාංගනය පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමශර්න ආරම්භ කර ඇත.

**මරණකරුවන් අවුරුදු 56 හා 26 වයස්වල පසුවන යාය 17, පහල මාරගහවැව ප්‍රදේශයේ පදිංචි පියා සහ පුතා වේ.**

කලක සිට පැවති ආරවුලක් මත මෙම ඝාතනය සිදු කර ඇති බවට දැනට සිදු කරන ලද විමශර්නයේදී අනාවරණය වී ඇත. ඝාතනය සම්බන්ධයෙන් සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 23 හා 27 වයස්වල පසුවන යාය 17, පහල මාරගහවැව ප්‍රදේශයේ පදිංචි සහෝදරයන් දෙදෙනෙකි.** රාජාංගනය පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 02. ද්විත්ව මනුෂ්‍ය ඝාතනයක් - සාලියවැව පොලිස් වසම

2025.04.12 වන අද දින දහවල් කාලයේ සැලියවැව පොලිස් වසමේ දුනුමඩලැව ප්‍රදේශයේ නිවසක සිටි කාන්තාවකට හා පිරිමි පුද්ගලයෙකුට තියුණු ආයුධයකින් පහරදී ඝාතනය කර ඇති බවට සැලියවැව පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමශර්න ආරම්භ කර ඇත.

**මරණකාරිය හා මරණකරු අවුරුදු 76 හා 80 ක් වූ දුනුමඩලාව ප්‍රදේශයේ පදිංචි අඹු සැමි යුවළකි.**

මරණකරුවන්ගේ මුණුබුරා විසින් මෙම ඝාතනය සිදුකර ඇති බවට විමශර්නයේදී අනාවරණය වී ඇති අතර වයස අවරුදු 25 ක් වන සැකකරු අත්ඩංගුවට ගෙන ඇත. සැලියවැව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 03. දුම්රියක ගැටී පුද්ගලයෙකු මියයාම - මාතර පොලිස් වසම.

2025.04.12 වන අද දින දහවල් කාලයේ මාතර පොලිස් වසමේ නූපේ දුම්රිය ගේට්ටුව ආසන්නයේදී අනුරාධපුර සිට බෙලිඅත්ත දක්වා ධාවනය වූ සීඝ්‍රගාමී දුම්රියක පුද්ගලයෙකු ගැටී මියගොස් ඇති බවට මාතර පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමශර්න ආරම්භ කර ඇත.

**මරණකරුගේ අනන්‍යතාව මෙතෙක් තහවුරුවී නොමැති අතර අවුරුදු 35 ක් පමණ වූ පුද්ගලයෙකි. අවසන් වරට නිල් පැහැති ටී ෂටයක් හා නිල් පැහැති කලිසමක් හැඳ සිට ඇත.**

මෘත ශරීරය මාතර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත.මාතර පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 04. මාරක රිය අනතුරක් - නාරම්මල පොලිස් වසම.

2025.04.12 වන අද දින සවස් කාලයේ නාරම්මල පොලිස් වසමේ නාරම්මල කුලියාපිටිය මාගර්යේ හොරොම්බාව ප්‍රදේශයේදී නාරම්මල දෙස සිට කුලියාපිටිය දෙසට ගමන් ගත් පාපැදිකරුවෙකු මාගර්යේ දකුණු පසට හැරවීමට යාමේදී, පසුපසින් පැමිණි ලොරි රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පාපැදිකරු බරපතල තුවාල ලබා කුලියාපිටිය රෝහලට ඇතුලත් කිරිමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 73 ක් වූ මොල්ලිගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කුලියාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර නාරම්මල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**